


## දම් බිමක් වේවා මේ කතරත්!!!

සියපතක සුවඳ සමඟ
බෝ පතක සිහිල මුසු වී
සම්බුදු සදහම් සුවය
සයුර තරණා පවනක්ව
ගලා ඒවා මේ රුදු කතරට

නිවා විඩාබර සිත්
විකසිතව මෙත් පියුම්
විසුණු වී සැහැසිකම්
සැනසී සම්බුදු සිහිලෙන්
දම් බිමක් වේවා මේ කතරත්!!!

චූලිකා දසනායක

# පහන් වැට

සංස්කරණය
**තුෂාරි ප්‍රියංගිකා**

## සැඟවුනු සිල් සුවඳ

දෑ සමන් මල් මිටක් සලා මද     මාරුතේ
තුරුලතා සිනාසී මගේ මුහුනට     එබේ
මන්දිරේ ඇවිලෙනා නෙක පහන් දැල්     වටේ
නුඹ ගෙනා සිල් සුවඳ කොහේදෝ     සැඟවුනේ

ගලා සුවදක් සඳුන් මගේ මුහුලත     හැපේ
බෝ ධියෙන් ගිලිහෙනා පත් දෑත මත     වැටේ
මන්දිරේ බැබලෙනා කරදාසි මල්     වටේ
නුඹ ගෙනා සිල් සුවඳ කොහේදෝ     සැඟවුනේ

කල්බලා ඉවත ගිය මෙත් හැඟුම්     සොයමිනේ
අප මෙදා ගං තෙරක අතරමං වු     මෙනේ
ගලායන දියකඩේ පහල ගං     බලමිනේ
නුඹ ගෙනා සිල් සුවද කොහේදෝ     සැඟවුනේ

චන්ද්‍රිකා ද සිල්වා

## මිහිඳු හිමියනි

සමග පිරිවර තිස්ස නිරිඳුන් මහ වනය පීරා     ගියේ
අහිංසක තිරිසනුන් දඩයම විනා අන් වෙන     කාරියේ
ඒ වු මහරජ දොහොත් මුදුණත තබා අවි බිම හෙලනු     රිසියේ
බුදුන් දෙසූ දම හදට එක්කොට මිහිඳු හිමියන්     ඉදිරියේ

පොසොන් මස පුන් පොහෝදා බුදුදමින් සිරිලක එකලු     වූයේ
මුළු මහා ජන සකල ලක්වැසි ඒදින් මතු බුදු සරණ     පැතුයේ
නේක විධ වු මහ රජුන් පසු සසුන සිරිලක පැතිර     වූයේ
මහ රහත් සහ සුගත හිමියන් වැඩිය රන් කෙත සදා     සිරියේ

ධන බලය වෙත ගිජුව ඇති සත සටන් කරමින් අවි     දරන්
දිළින්දන් පෑගෙනු, මියෙනු ඇත නොනවතින තත්භාව     සමගින්
නිගරු කරමින් අමිල දහමට පැතිරවූ මහ මිහිඳු     හිමියන්
සොබා දම් දිනිතිය මගේ බිම රකිනු උගහට දෝ     කෙමෙන්

දහස් ගණනක් වස් ගෙවී ගොස් ඇතිය මැද කම්කටොළු අතරින්
සුරැකි ඇත බුදු සසුන හුයකින් දිනේවා අප මහ     සඟුන්
ලොවේ සැමදේ අනිත්‍ය යි හිමි දෙසූ සේ මුළු සතට     ඔවදන්
නිමල බුදු දම ඉවත් වේවිද, අධර්මය ලොව ඉතිරි     කරමින්

ධර්ම කේ. කොඩිප්පිලි

## අම්මා

සඳරැස් ගලන විට මිදුලට ගස්     අතරින්
උකුලෙහි මා හොවා රස කවි පද     ගයමින්
නිදි කල අයුරු සිහිනෙන් ගෑ සුවඳක්     මෙන්
මතකය කිති කවයි නිදි යහනට     ඇවිදින්

ළිඳ ළඟ පිච්ච පඳුරෙන් මල් නෙළා     ගෙන
නංගිලා සමඟ මම දෙපසින් තබා     ගෙන
ගෙයි ඇති බුදු පිළිමෙ ළඟ දණ ගසා     ගෙන
මතකයි අපේ අම්මා ගැයු බුදුන්     ගුණ

මහමෙර වගේ කිසි දෙයකට සැළුණෙ     නැතී
වෙඩරු පිඩක් මෙන් උණුවන හදක්     ඇතී
කරුණා ගුණය උතුරා යන හිතක්     ඇතී
අම්මේ නුඹෙ ගුණ වැනුමට වචන     නැතී

කන්නට බැහැ කියා බත් පත පසක     හොවා
දුවනා විටදි ගෙය තුළ සහ මිදුලෙ     පවා
ලුහු බැඳ ඇවිත් අල්ලා ගෙන උකුලෙ     හොවා
කැව් ඔබෙ මතකෙ ගෙන එයි නෙතු කඳුළු     පවා

මට කැව් ලෙසට මගෙ පුතු ඔබෙ උකුලෙ හොවා
කැව් බත් ගුලි කුරුල්ලන්ගෙ හැඩය     මවා
සිතුවම් අඳින පුතුගේ මතකයෙහි     පවා
ඇති වග සහතිකයි සුවඳක් සිහිනෙන්     ගෑ..

ගාමිණී ලක්ෂ්මන් ගමගේ
හැම්ප්ටන් පාර්ක්

## ඔබෙ පොඩි දුව ලෙසින් මතුත්....

සෙනෙහස ගැන නොලිව්වාට
ගුණ ගීයක් නොගැයුවාට
ඔබෙ සෙනෙහස හා සමකළ
වෙන කිසිවක් නොවිඳි අපට
ජීවිත බර උර දරුවද
එය සැහැල්ලු ලෙසින් සිතු
දරුවන් වෙනුවෙන් සෙනෙහස
මේ තරමට දුන්නා වූ
තව පියවරු ලොව සිටියත්
ඒ හැමටම වඩා උතුම්
ඔබ මට මෙන් අප හැමටම
ඔබ දුන් දිරියත් සමගින්
ලොව දිනනා විට දරුවන්
ඇත ලොවක හිඳ හිනැහෙන
බව දනෙනා මුත් අපහට
ළඟට ලංව තුරුළට වී
සැනැහී හුරතල් වන්නට
අප කළ පින් මදි වූවත්
ඔබෙ පොඩිදුව ලෙසින් මතුත්
හමුවන්නට පෙරුම් පුරමි

මේනකා ජයතිලක
ක්වීන්ස්ලන්තය

## කැඩපතින් දුටු සත්‍යය

එකල්හි නුඹ සොඳුරුතම යෞවනිය
පුර පෝය සඳ මඬල පරදවන වත කමල
ඉසිඹු ලද හැම කල්හි මා වෙතට පැමිණෙමින
සොඳුරු වත රුව ගුණය රහසේම විමසමින
මම එදා ඔබට සිටි ප්‍රාණ සම යෙහෙළිය
නුඹෙ රුව ගුණය ගැන නොසඟවාම හෙළි කල
මෙකල්හි නුඹ ලෙඩ මහළු මිත්තණිය
කෙළවරේ කාමරේ ඇඳ උඩම කල් ගෙවන
මා ද දැන් ඔබ මෙන්ම ජරාපත්ය, වියපත්ය
හැමෝටම එපා වී මුල්ලකට තල්ලු වුණ
අඳුනන්න පුළුවනිද මිතුරියේ කව්ද මම??
මම ඔබේ කැඩපතයි
ලොව දකින ඇස් ලැබුණා..

**සුභාෂිණී හේරත්**
ඇට්වුඩ්




ඇල්ල වටා ඇති කඳු ගැට     රමණීයයි
වන ගත කුරුල්ලන්ගේ ගී හඬ     රාවයි
විසල් තුරුලතා නිල් වියනත්     සාදයි
ඔබගේ පරිසරය කාටත් ප්‍රිය     ජනකයි

උස් කඳු ශිඛර මත ඇති ගල් තලා     මතින්
හෝ! හෝ! හඬ නගා පෙණ පිඩු විසුරුවමින්
සුසිනිඳු සුදෝ සුදු සළුපට පැළැඳ     ගමින්
දුන්හිඳ ඇල් ඇද වැටෙනවා ඔකඳ     වෙමින්

අහස් ගැබෙන් බැස එන සුරඟනන්     ලෙසින්
ලාලිත ගමනකින් සුකොමළ බඳ     සලමින්
සීතල රිදී දිය වැල් ගල් කුළු     සිඹිමින්
පහළට ගලා ඒ දිය කඳ සසළ     වෙමින්

පා වෙන වළා කැටි වාගේ ගුවන්     තලේ
සීතල සුමුදු සුදු සුන්දර දිය     ඇල්ලේ
ගිමන නිවන සිසිලස ඇත සෙළ     විල්ලේ
මොහොතක් රැඳෙන්නට පුළුවනි සැනසිල්ලේ

**සෙනෙහෙලතා රත්නායක**
ක්ලේටන්

## චපල සිත

සීගිරි ළඳ පරදන රුව ඇති ළඳ
රූපෙට මිස සිතකට නැත පෙම් බැඳ
මම සීගිරි අප්සරාවියක් නොවුනට
පෙම් කෙරුවේ කිම්දී හද පතුලට

පෙරදා ඔබෙ සිත කියවූ දින සිට
හැමදාමත් පැතුවේ ඒ සෙනෙහස
දූවිල්ලක් නොවටින මිල මුදලට
ආදරයක් යට කෙරුවේ කොහොමද

නිලුපුල් නෙත් දුක් කඳුළින් රතු කර
චපල වුනේ ඔබ හැර අන් කවුරුද
රන් කැටි පුතු නොහිටින්නට මම අද
සැනසිල්ලෙන් නිදියම් පස් කන්දක

ශ්‍රියා කුමාරසිංහ

## කාලය



ඇවෑසී විට
කොයි තරම්
වටිනවාද
JJE

## පියෙකුගෙ අඳෝනා

ඩා බිඳු නැඟෙනා කල ගතේ....
නිවා ගන්නට පවස....
පැන් පොදක් නැති
වැලි කතරේ....
වාතලය උණුසුම්ය
මගේ හදවත වගේ...
කාසි බාගෙ සොයන්නට
රැකුමට දරු පැටවුන්
මගේ...
ආවත්....
මැද පෙරදිගට..
නැත නිවනක් සිතට.

රමණී පෙරේරා
බන්ඩූරා

## සිරමැදුර !

සසර කතර සිරකුටියෙක
තනිවී වැලපෙන හදවත
පාලු අඳුරු තනිකම මැද
සෙනෙහස වග මුමුනණ සඳ

සොඳුරු හදේ පතුල රැඳුන
සදාතනික ආදරයක
මිහිරි හැඟුම් කැටි කරගෙන
නිසඳැසකට ගොනුකල මැන

නුදුරු දිනක වියපත්වී
මා හදවත නිසසල සඳ
සොහොන් කොතේ සෙවනට වී
හද පාලුව මකාගන්න
ලියු නිසඳැස ගයනු මැනවි !

විජයසිරි තිලකුමාර
බ්‍රිස්බේන්

පොසොන් සඳේ සිහිලස
ඔබගේ හදට දැනේවා!!!

කියවන්න... ලියන්න...
තොරතුරු දැන ගන්න..
www.ketapathpawra.com
වෙබ් අඩවියට ගොඩ වෙන්න.. සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත් කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.